www.slida.lk

SLIDA
"Learning Confers Discipline"

# කලමණා...

## අර්ධ වාර්ෂික ප්‍රකාශනය...




සතුටින් වැඩ කිරීමට
පුරුදු වෙමු

An Overview of the
Auditing in Sri Lanka
Public Sector

A Comparative study
of Categories of Economic,
Social and Cultural Rights
in Constitutions of india
and sri Lanka

දුටුවෙමි අත්දුටුවෙමි

ප්‍රායෝගිකත්වය තුළින්
ඵලදායිතාවයට ලං වෙමු

පරයේෂණාත්මකව රාජ්‍ය
ප්‍රතිපත්ති සම්පාදනය හා
රාජ්‍ය සංවර්ධනය

පුස්තකාල පොත්
සමීක්ෂණය හෙවත්
තොග සත්‍යාපනය

Community-based Approaches
for the Sustainable Management
of Small Scale Fisheries

நிலைபேறான அபிவிருத்தியும்
சூழல் முகாமைத்துவமும்

කළමණා
අර්ධ වාර්ෂික ප්‍රකාශනය
08 වෙළුම - 01 කලාපය
ජනවාරි - ජුනි 2020
ISSN 1391 8222

ප්‍රධාන සංස්කාරක
ආචාර්ය පී.ජී.ඩී. ප්‍රදීපා සේරසිංහ

සංස්කාරක
ආචාර්ය ඩබ්.එම්.එම්.ජී.ඩී. විජේකෝන්
අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් (පර්යේෂණ හා සංවර්ධන/කළමනාකරණ නොවන පුහුණු)

සංස්කරණ සහාය
ධම්මිකා සේනාධීර

ග්‍රැෆික් නිර්මාණය
දමිත් තුෂාන් රණතුංග

දමිළ සංස්කරණ සහාය
රොහිණි මාරිමුත්තු

ප්‍රකාශනය
පර්යේෂණ මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
28/10, මලලසේකර මාවත, කොළඹ 07
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය:
http//www.slida.lk
දුරකථන: 0115980281, 0115980282
ෆැක්ස්: 0112 584406
ඊමේල්: sandharani@slida'lk

මිල රු: 150/-

මෙම කළමනා අර්ධ වාර්ෂික ප්‍රකාශනයෙහි අඩංගු ලිපිවල අදහස්
එහි ලිපි රචකයින්ගේ පෞද්ගලික අදහස් මිස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අදහස්
නොවන බව කරුණාවෙන් සලකන්න

# පටුන...

## உள்ளடக்கம் Content


| | | |
|---|---|---|
| 01. | සතුටින් වැඩ කිරීමට පුරුදු වෙමු. | 2-4 |
| 02. | An overview of the auditing in Sri Lanka public sector | 5-8 |
| 03. | A Comparative study of Categories of Economic, Social and Cultural Rights in Constitutions of india and sri Lanka | 9-11 |
| 04. | දුටුවෙමි අත්දුටුවෙමි | 12-13 |
| 05. | ප්‍රායෝගිකත්වය තුළින් ඵලදායිතාවයට ළං වෙමු | 14-16 |
| 06. | පරයේෂණාත්මක රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා රාජ්‍ය සංවර්ධනය | 17-18 |
| 07. | පුස්තකාල පොත් සමීක්ෂණය හෙවත් තොග සත්‍යාපනය | 19-23 |
| 08. | நிலைபேறான அபிவிருத்தியும் சூழல் முகாமைத்துவமும் | 24-26 |




# 01. සතුටින් වැඩ කිරීමට පුරුදු වෙමු.

**ලසන්ත ගමගේ**
ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ශ්‍රී ලාංකිකයන් වන අප වර්තමානයේදී මුහුණ දෙනු ලබන අර්බුද වල තිව්‍රතාවය දිනෙන් දින ඉහළ යමින් කායිකව හා මානසිකව අපි පීඩා විඳිමින් සිටිමු. වසර කිහිපයකට පෙර සිංහල හින්දු අවුරුද්ද, වෙසක්, රාමසාන්, නත්තල්, දීපවාලී ආදී සංස්කෘතික උත්සව වෙනදා මෙන් රිසිසේ සැමරීමට තිබූ අවස්ථාවන් අහිමිවී ඇත. පාස්කු ප්‍රහාරය, කොවිඩ් වසංගතය ආර්ථික හා දේශපාලන අර්බුද විසින් අපි පීඩා විඳිමින් සිටිමු. එපමණක්ද නොව සාමාන්‍ය ජන පීඩනය තුළ අප මුහුණ දෙන ගැටලු වන පවුල් ආරවුල්, දරුවන්ගේ ගැටලු හා ආයතනික ගැටලු වලටද අපට මුහුණ දෙන්නට සිදු වේ. මෙම සියලු අභියෝග හමුවේ ඔබගේ ඉලක්ක පරමාර්ථ හා ඔබගේ සිහින වෙත ළඟා වීම දුරස්ථ වන බව මනසට දැනීම නිසා ඔබ අපේක්ෂා භංගත්වයට පත්වී අධෛර්යමත් විය හැකිය.

එහෙත් මතක තබා ගත යුතු වැදගත් කරුණ වන්නේ සතුටු සිතින් සම සිතින් මෙම ගැටලු වලට මුහුණ දීමට ඔබ සතු හැකියාව වඩ වඩාත් මුවහත් කිරීමට ඔබ කෙතරම් දක්ෂ වේද යන්නයි. සතුට (The Happiness) යනු කුමක්ද? මේ සඳහා විවිධ දාර්ශනිකයින් විවිධ මත පල කර ඇත. 1874) 1948 කාල වකවානුවේ ජීවත් වූ ප්‍රසිද්ධ පුවත්පත් කලාවේදියෙකු වූ බ්‍රිතාන්‍ය ජාතික හෝල් බෲක් ජැක්සන් (Holbrook Jackson) ගේ අදහස අනුව සතුට යනු ධෛර්යවන්ත බවයි. තෘප්තිමත් භාවයක් තුලින් වඩාත් තීව්‍ර ලෙස දැනෙන ධනාත්මක මානසික හැඟීම් මගින් මනසේ ඇතිවන යහපැවැත්ම ලෙස වඩාත් පුළුල්ව නිර්වචනය කළ හැකිවේ. ජීවිතයේ බොහෝ දෙනා බොහෝදේ සිදු කරනුයේ සතුට වෙනුවෙන් බව පවසයි.

විභාග ලිවීම, නිවාස ඉදිකිරීම, රැකියා උසස්වීම්, දරුවන්ගේ ජය, විවිධ ප්‍රිය උත්සව, ප්‍රිය භාෂණ, සංගීත සංදර්ශන මේ සියල්ල සතුටුවීම පිණිස අපේක්ෂා කරනු ලබන යම් ඉලක්ක විය හැකි නමුත් සතුට යනු ඉලක්කය සපුරා ගැනීම නොව ඉලක්කය වෙත ගමන් කිරීම බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත. එනම් ඔබ මේ මොහොත තුළ සතුටින් නොවේ නම් ඉලක්කයෙන් ඇති ඵලය කුමක්ද? ඔබගේ ඕනෑම භෞතික හෝ අධ්‍යාත්මික ඉලක්කයන්ට වඩා වැදගත් වන්නේ ඒ සඳහා වූ ඔබගේ කාර්ය භාරයයි. එහිදී ඔබට මානසික අංග 4ක් අඩු වැඩි වශයෙන් වර්ධනය කර ගැනීම වැදගත් වේ. එනම්,

- කැමත්ත (ඡන්දය) - මනස තුල අරමුණට ඇති කැමැත්ත
- අධිෂ්ඨානය - මනස තුල අරමුණ කෙසේ හෝ ඉටුකර ගන්නා බවට වූ දැඩි හැඟීම
- වීර්යය - මනස තුල අරමුණ වෙනුවෙන් ඊට අදාළ දේවල් ඉටුකිරීම සඳහා වූ උවමනාව
- ඉවසීම - මනස තුල අරමුණ ඉටුකර ගැනීම තුළින් ලැබෙන ප්‍රතිලාභ විමසීමයි.



මෙම මානසික තත්වයන් 4 ඔබගේ මනස තුළ එකවර ඇති නොවන අතර එය ක්‍රමානුකූලව වර්ධනය විය යුතුවේ. ඒ සඳහා අවශ්‍යයම සාධකය සතුටයි. ඔබ තුළ සතුටක් නොමැති නම් එනම් ධනාත්මක මානසික තත්වයක් තුළ තෘප්තිමත් හැඟීමකින් යුතුව ඔබගේ කටයුතු පවත්වාගෙන යාමට නොහැකි නම් ඔබ අසාර්ථක වේ. තවද ඔබ දෙමාපියෙක් ලෙස දරුවන්ට, නායකයෙකු ලෙස ඔබගේ කාර්ය මණ්ඩලයට, මිනිසෙකු ලෙස සමාජයට වෙනස් ආදර්ශවත් අත්දැකීම් සමුදායක් එක් කරනු ලබන විශිෂ්ටයෙක් වන්නේ කෙලෙසද? ඔබ ඔබගේ සාර්ථකත්වය වෙනුවෙන් බොහෝ දේ කරනු ලබයි.

න්‍යායාත්මක හා වෘත්තීය දැනුම ලබා ගැනීම, පුහුණු වීම් ලැබීම, රැකියා උසස් වීම් ලැබීම, ඔබගේ දක්ෂතා හා හැකියාවන් වර්ධනය ඒ අතර තිබිය හැකි නමුත් ඔබගේ සාර්ථකත්වයේ ප්‍රාණාත්මක හා ගුණාත්මක භාවය මනිනු ලැබිය හැකි වටිනා මිනුම් දණ්ඩක් වන්නේ ඔබගේ කර්තව්‍යන් හේතුකොට ගෙන අනෙකා ලබන සතුට මතය. එය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය වන්නේ නම් ඔබගේ සාර්ථකත්වයද වර්ධනය වේ. එනම් ඔබ නිසා තවත් පුද්ගලයෙකු සතුටට පත්කළ හැකි නම් ඔබ සාර්ථක වේ. නමුත් ඔබගේ කර්තව්‍ය සතුටින් නොවේ නම් තවත් පුද්ගලයෙකු ඔබ සතුටු කරන්නේ කෙසේද?

ඔබගේ සිතහවෙන් පිරියන විට ධනාත්මකව පිරියන විට සුභවාදී ලෙස ප්‍රශ්න ගැටලු වලට මුහුණ දෙනු ලබන විට ඔබට බොහෝ දෙනෙකු සතුටට පත්කළ හැකිවේ. ඔබට සතුට අවශ්‍ය නම් එය නිරායාසයෙන් ඔබ වෙත ළඟා නොවේ. අනිවාර්යෙන්ම ඔබ එය පුරුදු පුහුණු විය යුතු වේ. ඔබ බොහෝ දේ ඉගෙන ගනී, පුහුණු වීම් ලබයි, නමුත් ඔබට අවශ්‍ය වන සතුට ලැබීම සඳහා ඔබ පුරුදු පුහුණු වී ඇතිද? ඔබ ඒ සඳහා පුහුණු නොවන්නේ නම් ඔබට සතුටු වීමට අසීරු වේ. එවිට ඔබගේ අරමුණ අසාර්ථක වී ඔබ නිසා බොහෝ දෙනෙකු අසතුටට පත්වේ. දුකින්ද සිටිනු ඇත. මෙලෙස ඔබතුල සතුට ලැබීමට ඔබගේ මනස පුරුදු පුහුණු කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රම කිහිපයක් විස්තර කරමු.

## 1. භාහිර පීඩා වලදී ඔබ උපේක්ෂාවෙන බැලීමට පුරුදු වන්න.

අටලෝ දහම අප කාටත් පොදු වේ. ලාභ-අලාභ, යස-අයස, නින්දා-ප්‍රසංශා, දුක-සැප මේ සියල්ල අපට පොදු ධර්මතාවයන් වේ. ඕනෑම රටක ජීවත්වන අයෙකුට මෙම ධර්මතාවයන්ට මුහුණ දීමට සිදු වේ. ඔබට ප්‍රශංසා කිරීමේදී දැඩි ලෙස ප්‍රශංසාවට ඇලී යන්නේ නම් ඔබට නින්දා ඉවසිය නොහැකි වේ. එබැවින් ප්‍රශංසාවකදී ඔබ සිත සමබරව පවත්වාගෙන යාමට පුරුදු වන්නේ නම් එය අටලෝ දහමක් බව මෙනෙහි කරමින් සතුටු වන්නේ නම් ඔබට යමෙක් නින්දා කරන විටද සතුටු විය හැකිය.

## 2. අභියෝග හමුවේ නොසැලීමට ඔබ පුරුදු පුහුණු විය යුතුය.

ඔබ දක්ෂයෙකු වන්නේ සියල්ල ඔබට වාසි සහගත අවස්ථා වලදී ඔබගේ ක්‍රියා කාරකම් මත නොව අභියෝග හමුවේ ඔබට ඒවාට මුහුණ දීමට ඇති හැකියාව මතවේ. ඒ සඳහා නොසැලෙන අධිෂ්ඨානයක් මනස තුළ පුරුදු පුහුණු වීම වැදගත් වේ. ඔබගේ ජීවිතය බාධක වලින් පිරී යන විට ඔබට කළ යුතු දේ බොහෝ ඇත. එය ඔබට සැබවින්ම වාසියක් මිස අවාසියක් නොවන බවට ඔබ පුරුදු පුහුණු විය යුතුය.

## 3. ඔබගේ දින චර්යාව

ඔබ උදෑසන පිබිදෙන අවස්ථාවේ සිට රාත්‍රී නින්දට යන තෙක් ඔබගේ දින චර්යාව සැහැල්ලුවෙන් හා වගකීමෙන් යුතුව කළමනාකරණය කර ගැනීමේ ඔබ සතු කුසලතාවය ඔබේ සතුටට හේතු වේ. උදෑසන අවදි වී පළමු තත්පර කිහිපය තුළ ගැඹුරු හුස්මක් ගෙන මානසික ආතතිය දුරු කරමින් විශ්වය කෙරෙහි මෛත්‍රිය පැතිරවීමට ඔබට විනාඩි දෙකක හෝ තුනක කාලය ප්‍රමාණවත් වේ.

එ තැන් සිට ඔබ ඒ අවස්ථාවේ කලයුතු කාර්යය ගැන පමණක් අවධානය යොමු කිරීම ඔබ පුරුදු පුහුණු විය යුතුය. අනාගතයේ සිදු කිරීමට ඇති කටයුතු සැලසුම් කිරීම යහපත් දෙයකි. නමුත් එම කාර්යයන් පිළිබඳව දෙගිඩියාවෙන් අවිනිශ්චිතාර්ථයෙන් කටයුතු කරන විට මේ මොහොතේ ඔබගේ සතුට ඔබට අහිමි වී යනු ලබයි.

තවද ඔබ සිදු කරන කාර්යයයෙහි පල විපාක අඩු විය හැකි වේ. කෙටියෙන් පවසන්නේ නම් ඔබ මේ මොහොත තුළ ජීවත් විය යුතු බවයි. නමුත් මේ මොහොත තුළ ඔබ අතීතය පිළිබඳව පසුතැවෙන්නේ නම් හෝ අනාගතය පිළිබඳ අවිනිශ්චිතාර්ථයෙන් නම් ඔබට මේ මොහොත හෙවත් ඔබගේ ජීවිතය මගහැරී යනු ලබයි. තවද ඔබ කරන්නේ කුමක්ද? කතාකරන්නේ කුමක්ද? යන්න වගකීමෙන් මෙනෙහි කළ යුතුය. මේ මොහොතේ මා කතා කරන දෙයින් හෝ සිදු කරන දෙයින් මට හෝ වෙනත් අයෙකුට ප්‍රයෝජනයක් නොවන්නේ නම් ගෙවී යන මෙම වර්තමානය නිශ්ඵල වන බව ඔබට අවබෝධ විය යුතු වේ. නමුත් මේ සඳහා ඔබ ජීවිතය තුළ ක්‍රමානුකූලව පුරුදු පුහුණු විය යුතු බව සිතට ගන්න.

# 4. ඉවසීම හා මෛත්‍රිය

ඔබගේ ඉවසීමේ හැකියාව ඉහළ යන තරමට ඔබගේ සතුටද ඉහළ යනු ඇත. ඔබට අව්ව, වැස්ස, උණුහුම, සීතල, කුසගින්න ආදිය අඩු වැඩි වශයෙන් දැනෙන විට ඒ කෙරෙහි ඔබ කලකිරෙන්නේ නම් ඔබගේ වැඩ කටයුතු අතපසු කරන්නේ නම් ඔබගේ සතුට අඩුවී යයි. මෙලොව කිසිම දෙයක් ඔබගේ සිතට අවශ්‍ය පරිදි හෝ සිත සෑහීමට පත්වන පරිදි සිදු නොවන බව මතක තබා ගත යුතු වේ. එබැවින් එය සාමාන්‍ය තත්වයක් සේ සැලකීමට ඔබ පුරුදු විය යුතුය. වර්ෂාවක් නම් වැටෙන වැහි බින්දු සීතල සමග එකතු වීමට ඔබ ශක්තිමත් විය යුතුය. දැඩි අව්ව රශ්මියක් පවතින විට දහඩිය සමග ඔබ එකතු වී ඔබගේ වැඩ කටයුතු සිදු කිරීමට පුරුදු පුහුණුවත්ම ඔබට සතුටින් සිටීමට හේතුවේ. ඔබගේ පවුලේ සාමාජිකයින් ඔබගේ කාර්යාලයේ සාමාජිකයින් මගතොට සිටිනවුන් කරන කියන දෑ හේතුකොටගෙන ඔබ අසහනයට පත්වේ නම් ඔබේ සිත සෑහීමට පත් නොවේ නම් ඔබට සතුටින් සිටීමට නොහැකි වන බව සිතන්න. එබැවින් වෙනත් අයෙකු කරන කියන දෑ තුළින් ඔබ අසහනයට පත්වන්නේ නම් විඳවන්නේ ඔබම බව සිතන්න.අහිමි වන්නේ ඔබගේ හැකියාව හා ඔබ විසින් ජනිත කරන ප්‍රතිඵලදායි නිමවුම බව සිතට ගන්න.ඒ සඳහා කලයුතු හොඳම දෙය මෛත්‍රිය වේ. ඔබේ සිතට අකමැත්තක් හෝ නොරිස්සුමක් පැමිණෙන විට ඔබ ඒ කෙරෙහි මෛත්‍රිය පැතිරවීමට පුරුදු පුහුණු විය යුතුවේ. අන් හැම දෙනාටම ඔබට මෙන් හුස්ම වැටෙන, ඔබට මෙන් බඩගින්න දැනෙන ඔබට මෙන් ආවේග දැනෙන ඔබට මෙන් දුක් පීඩා දැනෙන අය වේ. නමුත් ඔබ ඒ තත්වය අවබෝධ කරගෙන ඔවුන් කෙරෙහි මෛත්‍රිය පැතිරවීමට පුරුදු පුහුණු වනවිට එහි ප්‍රතිලාභ ඔබට හිමිවේ.

# 5. සසදා බැලීම

බොහෝ දෙනෙකුට සතුටක් නොමැති වීමට ප්‍රධාන හේතුවක් වන්නේ අන් පුද්ගලයින් සමග වැරදි ලෙස සසදා බැලීම වේ. අසල්වැසියන් සමග හෝ කාර්යාලයේ ඉහළ හෝ පහළ නිලධාරින් සමග සසදා බැලීමේදී එය හීන මානය අධි මානය හෝ ඊර්ෂ්‍යාව සමග සිදු වන විට ඔබට සතුටක් නම් නොලැබෙනු ඇත. අන් අය කරන කියන දෑ, හැකියාවන් හා ලැබෙන වරප්‍රාද ආදිය සමග ඔබව සසඳන විට ඔබතුල හටගනු ලබන හැඟීම් ඔබට පාලනය කර ගැනීමට නොහැකි වන විට ඔබ කරන කියන දෑ තුළින් ඔබට විශාල විනාශයක් සිදු විය හැක. ඔබගේ ගමන ඔබ ධෛර්යයෙන් යුතුව ගමන් කරන්න. ඔබට සාපේක්ෂව අනෙකාට ලැබෙන නොලැබෙන දේවල් නොව ඔබ සමාජයට මුදාහරින ප්‍රමාණාත්මක හා ගුණාත්මක සේවය ඉහළ නංවන්න. එහිදී අනෙකා විසින් කරන කියන දෑ තුලින් පාඩම් ඉගෙන ගන්න. ඔබ මේ සමාජය තුළ මවක්. පියෙක්, සහෝදරයෙක්, වෘත්තිකයෙක්, ව්‍යාපාරිකයෙක් හා නිලධාරියෙක් ආදී වශයෙන් වගකීම් දරමින් විවිධ භූමිකාවන් ඉටු කරනු ලබයි. මෙම කාර්යයන් හා වගකීම් ඔබ තුළින් නිවැරදිව ඉටු කිරීම සඳහා ඔබ වඩ වඩාත් ශක්තිමත් විය යුතුය. ඒ සඳහා සතුටින් සිටීමත් සතුටින් රාජකාරී කිරීමත් වැදගත් වේ. ඔබ තුළ සතුටක් නොමැති නම් ඔබට වෙනත් අයෙකු සතුටින් තැබීමට නොහැකිය.

තවද ඔබ අසතුටින් සිටින්නේ නම් ඔබගේ ජීවිතයේ ඵලය කුමක් වේද? කිසිදු දිනක ප්‍රශ්න ගැටලු අඩුවන්නේ නැත. එම ප්‍රශ්න ගැටලු වල මුහුණුවර පමණක් වෙනස් වනු ඇත. ඔබ දක්ෂ වන්නේ එම ප්‍රශ්න ගැටලු වලට සතුටින් මුහුණ දෙන්නේනම් ය. සතුට යනු නිරායාසයෙන් ඇති වන්නක් නොවේ. ඒ සඳහා ඔබ පුරුදු පුහුණු විය යුතුය. එය පුරුදු පුහුණු වන තරමටම ඔබගේ ජීවිතය ඔබට අර්ථවත් වනු ඇත.



# 02.

# An overview of the auditing in Sri Lankan public sector

**L.A.S.G. Perera**
BSc Mgt. J'pura, SLAS
Business Names Registrar
(Western Province)



An important method used to detect corruption in both public and private sector organizations is the auditing process. A simple definition of an audit, provided by the Merriam-Webster dictionary, is "a formal investigation of an organization's or individual's accounts or financial situation" as well as "a methodical examination and review". Audit can be internal, meaning that they are conducted by the organization itself, or external, which means they are conducted by another outside independent entity. Internal and external audits have different purposes. Internal audits review items such as the effectiveness of an organization's safeguards against fraud and corruption, whereas external audits often focus on an organization's financial statements and whether that organization has followed all relevant laws and regulations. Internal audit offer the management of an organization a snapshot of how policies and procedures are functioning, while external audits give a broader view and are often public. Audits are an example of integrity management mechanisms.

## Government Auditing

Government audit serves as a mechanism or process for public accounting of government funds. It also provides public accounting of the operational, management, programme and policy aspects of public administration. Not only that, it also ensures accountability of the officials administering them. It is the systematic process of collecting, recording, classifying, summarizing and interpreting the financial transactions relating to the revenues and expenditures of government offices. It reveals how public funds have been generated and utilized for the welfare of the general public.





# Government Auditing Against Corruption

Corruption in public sector means improper or unlawful actions by public sector staff or agencies or actions of private individuals who try to improperly influence public sector functions or decisions.Government auditing system plays a very important role in maintaining financial and economic order and improving government accountability and transparency. Though a great deal of research has discussed the role of government auditing in discovering and deterring corruption, there is little empirical evidence on whether government auditing actually helps to reduce corruption. Both internal and external audits can play a substantial role in detecting corruption . In South Africa, for example, auditors are legally required to report any suspicious activity. In many countries, the role of an external auditor of public institutions is assigned to specialized governmental body such as supreme audit institution or national audit office. Such specialized bodies have an important role in controlling public expenditure and ensuring accountability in the public sector. Therefore, they should be granted independence to effectively perform their oversight functions.



# Auditor General Department Of Sri Lanka

The beginning of the present Audit Department in Sri Lanka, then known as Ceylon, can be traced to early British times. From the records available it would appear that there had been an Auditor-General by the name of Cecil Smith as far back as the year 1799, just three years after the British occupation of the maritime provinces of the Island in 1796.

The Auditor General of Sri Lanka is the head of the Auditor General's Department. The Auditor General through the Auditor General’s Department provides an independent review of the performance and accountability of the public sector institutions and reports to Parliament. The Auditor General’s Department aims to meet the needs and expectations of the Parliament, the executive and its clients and to add value to public sector performance and accountability. This independent review is thus performed to ensure the propriety, regularity and compliance with all the statutory and other regulatory requirements and the economy, efficiency and effectiveness of the operations.

Article 154 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka provides the mandate for the Auditor General to audit public sector institutions, which can be reproduced as;
The Auditor General shall audit the accounts of all Departments of Government, the Offices of the secretary to President, the Offices of the secretary to the Prime Ministers, the Offices of the Cabinet of Ministers, the Judicial Service Commission, the Constitutional Council ,the Commissions referred to in the Schedule to Article 41B ,the Parliamentary Commissioner for Administration, the Secretary General of Parliament and the Local Authorities, Public Corporations and business or other undertakings vested in the Government under any written law and companies registered under the companies registered or deemed to be registered under the Companies Act, No.7 of 2007 in which the Government or a public corporation or local authority holds fifty per centum or more of the shares of that company including the accounts there of.

- Part II of the Finance Act, No. 38 of 1971 which provides for audit of Public Corporations.
- Section 23 of the Provincial Councils Act, No. 42 of 1987 - which provides for Audit of Provincial Councils.
- Section 219 of the Municipal Councils Ordinance (Cap. 252) which provides for Audit of Municipal Councils.
- Section 181 of the Urban Councils Ordinance - (Cap. 255) which provides for Audit of Urban Councils.
- Section 172 of the Pradesiya Sabhas Act, No. 15 of 1987 - which provides for Audit of Pradesiya Sabhas.
- Section 58 of the Agrarian Development Act, No. 46 of 2000 - which provides for Audit of Agrarian Development Councils.
- Section 9 of the Sports Act, No. 47 of 1993 - which provides for Audit of Sports Associations.

The Auditor General has also been vested with the authority by the Constitution to engage in the services of qualified auditors to assist him in his work. He also has the power to obtain the assistance of specialists in the examination of any technical, professional or scientific problem relevant to the audit. According to Article 154(5) of the Constitution, the Auditor General is entitled to have access to all books, records, returns and other documents, stores and other property and to be furnished with such information and explanation as may be necessary for the performance and discharge of his duties and functions. The independence of the Auditor General is preserved to a great extent by the Constitution itself and the Article 153 of which states that.



# Limitations Of Government Auditing Of Sri Lanka

## Inadequate independence of the supreme audit institution.

The constitution of Sri Lanka states that "There shall be an Auditor General who shall be appointed by the President with the recommendation of the Constitutional Council and who shall hold office during good behavior. He can be removed from office by the President only on the grounds of ill health or infirmity or upon an address of Parliament." The Auditor General is appointed by the President. Therefore sometimes it may be inadequate independence of him and some officers may also not be independent. The office of the President and Prime minister's office was excluded from audit.

## Poor accounting environment

The Financial Regulations (1992), which are the main authority for public financial management in the general government sector, focus only on the input aspect of expenditure control. They are issued by the executive branch (not by the legislature) and do not have the force of law. The studies found that there is a significant and long-standing practice of non-compliance with the Financial Regulations, in form and in sprit. The result is that government financial statements presenting the financial condition of the State (the State Accounts) have not been available on a timely basis and are not comprehensive. In addition, the numbers are not completely reliable because of reconciliation and other problems. Reliability of financial data and timeliness of financial reporting have improved considerably in the presentation of financial statements prepare its financial statements in compliance with SLASs and take all necessary measures to ensure that the financial statements are audited in accordance with SLAuSs with the objective of presenting a true and fair view of the financial performance and financial position of such enterprises. A significant gap in the public financial accountability framework has been the lack of a mechanism for monitoring and reviewing outputs and outcomes of government expenditure.

## ■ Lack of executive capacity

There is a critical shortage of suitably skilled and motivated accountants and auditors in the public sector. Accountants to the public service are recruited through an internal government examination conducted by the Commissioner on Examinations. There is a cadre (or full complement of maximum number of positions) provided for in the government budget. This cadre is based not only on the demand for accountants but also on the availability of funds for the government personnel budget.119 Public sector accounting functions are under the control of the Sri Lanka Accounting Service, which staffs not only central government, but also Provincial Councils, Divisions and local authorities. Entry is by a competitive examination on commercial accounting and other topics. A limited examination is given to those already in the public service. The Sri Lanka Accounting Service has no support grade but uses officers from the General Clerical Service as support staff. Budget officers are not necessarily members of the Accountants Service. The Auditor-General has a separate cadre that embraces both professional and support levels. Very few members of either service are ICASL or CIMA members.

## ■ Poor use of technology

Sri Lankan auditors normally use manual techniques and if they use modern technology to perform work it would be more efficient and effective.

# References


- Asian development bank march 2018, public financial management systems—Sri Lanka Asian development bank 2002,
- Diagnostic Study of Accounting and Auditing Practices in Sri Lanka Government of Sri Lanka 1978.
- The Constitution of the Democratic Socialist Republic of Sri Lanka.
- The World Bank, 2007, Sri Lankan public sector accounting.
- Auditor General's Department. (www.auditorgeneral.gov.lk)




# 03. A Comparative Study of Categories of Economic, Social and Cultural Rights in Constitutions of India and Sri Lanka

**Pranidhi P. Algama**
Associate Consultant, Sri Lanka Institute of Development Administration

**Arunoda N. Bopagamage**
Assistant Divisional Secretary, Colombo

## The International Obligation

The Universal Declaration of Human Rights adopted by the United Nations General Assembly in 1948 first outlined the economic, social and cultural rights. The International Covenant on Economic, Social and Cultural Rights (ICESCR) is the internationally recognized primary source of economic, social and cultural rights. India and Sri Lanka ratified the ICESCR in 1979 and 1980, respectively. Pacta sunt servanda or the cooperation on the basis of honouring agreements is part of the primary or universal goals of the international society. Article 26 of the Vienna Convention on the Law of Treaties 1969 establishes that "every treaty in force is binding upon the parties to it and must be performed by them in good faith" according to Pacta sunt servanda, and Article 27 specifies that a party may not invoke the provisions of its internal law as justification for its failure to perform a treaty. Donnelly (2013) holds a very significant approach to the State-centric concept of human rights recognizing the States as both the 'Principal Violator' and the 'Essential Protector' of human rights of the individuals of the country.

## Constitution and Economic, Social and Cultural Rights

A Constitution must evoke the unstinted loyalty of the people by its acceptability and its capacity to respond to the needs of the people. Fundamental rights need to be embodied in the Constitution in order for all to benefit, Mathew as edited by Baxi (1978) concurs. In a democracy the supremacy of the people predicates the entitlement of all rights that belong to a free people. A Constitution is both the testament and a work horse of a nation. Hence, the concept of rule of law is applied to the constitutions of India and Sri Lanka, to compare and contrast the above state obligations undertaken by the two South Asian neighbours.



## Fundamental Rights

Right to work (Article 6 of the ICESCR) is assured in Indian Constitution by Article 19 (1) (g) while the same is guaranteed by Article 14 (1) (g) of Sri Lankan constitution. Article 23 of Indian Constitution prohibiting exploitation should be interpreted with Article 19(1) (g) as it furthers the freedom of occupation meaningfully. This article in essence also establishes Article 7 of ICESCR which embodies the right "to the enjoyment of just and favourable conditions of work". Article 8 (a) of ICESCR provides that everyone has a right to form and join trade unions; and is guaranteed by Article 14 (1) (d) of Sri Lankan constitution. Despite absence of a specific constitutional provision in the Indian Constitution, Trade Union Act of 1926 states the right to form trade unions and it was accepted as a fundamental right by the Supreme Court of India under Article 19 (1) (c) of Indian Constitution which guarantees the right to form associations or unions in Uttar Pradeshiya Shramik Maha Sangh v. State of U.P . India, following the Constitution (Eighty-sixth) Amendment Act of 2002 (India), Article 45 of the Part IV (Directive Principles) was inserted in the Part III as Article 21A; guaranteeing the right to education embodied in Article 13 (2) of ICESCR. In Indian Constitution the right "to take part in cultural life" (Article 15 (1) (a), ICESCR) has not been directly ensured. Instead, the right of the minorities to protect and conserve their distinct cultures is enumerated by Article 29(1). In Article 30 (1), the right of the minorities to establish and administer educational institutions is recognized. However, Basu (2011) observes that Article 30 (1) is not an absolute right and, that this is subjected to the common set of regulations applicable for similar institutions as established by the Court in Islamic Academy of Education v. State of Karnataka. Article 14(1)(f) of Sri Lankan Constitution also guarantees the said Article 15 (1)(a).Article 32 of the Part III of Indian Constitution provides the right to move the Supreme Court to enforce any right conferred therein whilst; Article 17 of Sri Lankan Constitution provides that, in respect of an infringement or an imminent infringement of a fundamental right provided in the Chapter III, every person is entitled to apply to the Supreme Court.

## Directive Principles of State Policy

In contrast, it is distinctly stated by Article 37 of Indian Constitution and Article 29 of Sri Lankan Constitution that the provisions of Part IV and Chapter VI, respectively enumerating directive principles, are not enforceable by any court. Article 29 of Sri Lankan Constitution further illustrates that provisions of the Chapter VI listing directive principles do not confer or impose legal rights or obligations. However, Indian Supreme Court held in Kesavananda Bharati v State of Kerala that Directive Principles are on par with 'Fundamental Rights'. (Nanayakkara, 2012). Article 39, 42 and 43 of Indian Constitution extensively provides for various aspects of right to work assuring Article 7(a)(i), 7(a)(ii), 7(b), 7(d) and 10(3) of the ICESCR which recognize the right of everyone to the enjoyment of just and favourable conditions of work. Article 48A of Indian Constitution recognizing Article 12(2) (b) of ICESCR states that the State shall endeavour to protect and improve the environment. By Article 49 of Indian constitution, the State is obliged to protect all monuments, places and objects of national importance, embodying Article 15(2) of the ICESCR which mentions the necessity to conserve with reference to the cultural rights. Article 27(2) (c) of Sri Lanka Constitution is an embodiment of Article 11 (1) of ICESCR which recognizes "… the right of everyone to an adequate standard of living for himself and his family...". Article 27 (2) (h) of Sri Lankan Constitution pledging that "the complete eradication of illiteracy and the assurance to all persons of the right to universal and equal access to education at all levels" as a State objective is an embodiment of Article 13 of ICESCR. Article 27(9) of Sri Lankan Constitution which states that "State shall ensure social security and welfare" is consonant with Art 9 of ICESCR. Article 10 (1) of ICESCR is included in Sri Lankan Constitution as the Article 27 (12) which states that "State shall recognize and protect the family as the basic unit of society." The Supreme Court raised this provision as an additional matter in the case Vadivelu v. Officer-in-Charge, Sithambarapuram, Regional Camp Police Post, Vavuniya and others.

Sri Lankan Constitution embodies Article 10(3) of ICESCR in Article 27(13) stating that the State is to promote the interests of children and youth with special care and that they must be protected from exploitation and discrimination. By means of Article 27(14) Sri Lankan Constitution directs that the state shall "protect, preserve and improve the environment for the benefit of the community", hence embodying Article 12 (b) (2) of ICESCR.

### Rights enumerated in Chapters other than Fundamental Rights and Directive Principles of State Policy

Rights which are enforceable through courts other than the Supreme Court are a category peculiar to Indian constitution. Right to property which was transposed to Article 300A after taking it out from Article 19(1) (f) of Part III by the Forty-fourth Amendment Act (1978), is such a provision. Similarly, provisions such as Article 265 which reads that "no tax shall be levied or collected except by authority of law" and Article 301 which dictates "trade, commerce and intercourse throughout the territory of India shall be free", only subject to the provisions provided therein, are justiciable; but not by an application to the Supreme Court made under Article 32. A person aggrieved by a restriction imposed on such provisions may have his relief by an ordinary suit or, by an application under Article 226 to the High Court.

## Reference


- Basu, D.B. (2012). Introduction to the Constitution of India. (20th ed.).India: LexisNexis.
- Bull, H. (2012). The Anarchical Society: A Study of Order in World Politics. (Fourth ed.).UK: Palgrave Macmillan.
- Case book on Fundamental Rights. (1998). Colombo: The Open University of Sri Lanka.
- Constitutional Law I. (1985). Colombo: The Open University of Sri Lanka.
- Donnelly, J. (2013). Universal Human Rights in Theory and Practice. (3rd ed). USA: Cornell University Press.
- International Covenant on Economic, Social and Cultural Rights. 1966. Retrieved from https: //www.ohchr.org/en/professionalinterest/pages/-cescr.aspx
- Marasinghe, L. (2008). Evolution of Constitutional Governance in Sri Lannka. Colombo: Vijitha Yapa Publications
- Perera, N.M. (1979).Critical Analysis of the New Constitution. Colombo
- The Constitution of India. (1949). New Delhi: Government of India.
- The Constitution of the Democratic Socialist Republic of Sri Lanka. (1978). Colombo: Parliament Secretariat.
- Wickramaratne, J. (2013). Fundamental Rights in Sri Lanka. Colombo: Stamford Lake.


## Conclusion

It is evident that there are two distinct classifications of economic, social and cultural rights in both Constitutions. Two main categories are the enforceable rights and non-enforceable rights. The first category is classified into two subcategories with regard to Indian Constitution as rights enforceable by an application to the Supreme Court and rights enforceable otherwise. According to the Article 1(1) of the Indian Constitution "India, that is Bharat, shall be a Union of States". Hence the subjects devolved to the union territories and, the extents of such are essentially different from the powers assigned to the Provincial Councils in Sri Lanka – which is a unitary state as per the Article 2 of the Constitution. That is observed to be the reason for the absence of economic, social and cultural rights justiciable by any court other than the Supreme Court in the Constitution of Sri Lanka.

Further, this study found that Indian legislature and Indian judiciary have actively viewed economic, social and cultural rights as constitutional provisions which shall be modified and adapted as per the developments, circumstances and demands. In consequence, such rights enumerated under the Part IV of the Indian Constitution titled "Directive Principles of State Policy" are placed on par with the Fundamental Rights assured in the Part III of the Constitution; despite the fact that the former are expressly non- enforceable. It is concluded that this is a fundamental difference from the Sri Lankan practice.

# 04. දුටුවෙමි අත්දුටුවෙමි

**පී.ජී. පියවතී**
කළමනාකරණ සහකාර ෂ
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ෂාමේන් කාර්යාල සේවකයෙකි. මේ වන විටත් ඔහු පර්පූර්ණ මිනිසෙකි. පිටස්තරයෙක් ඔහු දෙස බලමින් පරිපූර්ණ මිනිසෙක් යැයි කීවද ඔහුට නම් හැගෙන්නේ පරිපූර්ණද නැතිද යන වචන දෙක අතර ඔහු සිරවී ඇති නියාවකි.

වසර 60 කට ආසන්න දිවි මගෙහි දිවියේ මුල් කාලයත් ඔහු එතැන් සිට අදියරෙන් අදියර මුහුණ පෑ සියලූම අවස්ථාවනුත් ඔහුට මැවි මැවී පෙනෙනුයේ මිත්‍රයින් සේය. අද නිවාඩු දිනයකි. ඉදින් තනිවම වෙසෙන ඔහු කල්පනා සාගරයක කිමිදී ඇති බව කවරෙකුට වුවද පෙනී යනු නියතය.

තරමක් උගත් තරමක් නූගත් වුවද ගමේ සියලූම හඳුනන අය හා නමින් පමණක්ම දන්නා අය ඔහුට ගෞරවයක් දැක්වූයේ සංවේදී පුද්ගලයෙකු වූ හෙයිනි. කෙනෙකුගේ දුක, සතුට මුසු සියලූ අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට ඔහුට නම් තිබුණේ පුදුමාකාර ඉවකි. රජයේ රැකියාවක නිරතව වසර 30 කටත් අධික කාලයක් සේවය කරනු ලබයි.

ඉතිං ඔහුට මේ කාලය තුල මුහුණ දීමට සිදුවූ සියළුම අත්දැකීම් සවිස්තර කරන අවස්ථාවකි.

කුඩා කලදී ලංකාවේ කුඩා ගමක ජීවත් වූ ඔහු තරමක් දුප්පත් දෙමාපියන් යුවලකගේ 7 වන දරුවා වූ අතර වැඩිමහලූ සියල්ලන්ගේ ආදරයට පාත්‍ර වූ බව නම් සැබෑවකි. එහෙත් අධ්‍යාපන කටයුතු කරගෙන යාමේදී බොහෝ අගහිගකම් තිබුණි. එහෙයින්ම ඔහුගේ සිතට ශක්තිය ධෛර්යය වැඩි වැඩියෙන් ලැබී ඇති බව ඔහුගේ වචන වලින්ම හෙලි වෙයි.හැකි පමණින් අධ්‍යාපන කටයුතු නිමා කල අතර ඊට සරිලන රැකියාවක් ලබා ගැනීමට ඔහුට පහසු විණි.

රැකියාවට ගිය දින සිට විෂම සමාජයක සම සමව ජීවත් වන්නට සිදුව ඇති හෙයින් සතුට හා දුක සමව බෙදාගෙන විනෝදයෙන් රැකියාවේ නිරත වූ බව එදා සිට අද දක්වා විස්තර අප වෙත දිග හරින විට ඔහුගේ මුහුණින් මතු වන සතුට අපමණ බව පැහැදිලිය.

එම කථා අසන විට අපට නම් දැනෙන්නේ සතුටට වඩා බොහෝ දුක් විඳිමින් එහු ඒ වෙනුවෙන් ඇප කැප වී ඇති බවකි. මුල් කාලයේදී කොළඹට ආසන්න ප්‍රදේශයක තාවකාලිකව නැවතී තම රැකියාව කළ අතර තමන්ගේ වියදම පවා එමගින් පියවා ගත නොහැකි වූ හෙයින් කොපමණ හෝ දුක් විඳ තමා පදිංචි නිවසේ සිට රැකියාවට යාමට ඔහු තීරණය කර ඇත.

පාන්දර 4 ට අවදිව නැතහොත් ඊටත් ප්‍රථම දුම්රියේ වේලාවට නිවසින් පිටවන ඔහු දුම්රියපලට පා ගමනින්ම යනු ලබයි. නියමිත වේලාවට දුම්රිය අල්ලා නොගතහොත් හැමදාම රතුඉර වදින බව සහතිකය. ඔහුගේ රැකියාවේ දසක 3 ක්ම දැන් පසුවී ඇත. ඒ දසක 3 තුල මුහුණ දුන් මතකයන් අතර දුම්රිය වැඩ වර්ජන නම් කොතෙක්ද? හැම වැඩ වර්ජන දිනයකදීම ඒක් අයෙකු අසාදිත තත්ත්වයට හෝ ජීවිතයෙන් සමුගන්නා ආකාරය සියැසින් දැක ඇත. මෙම දිනයන්හි හිර වී තෙරපී යම්තම් නොමැරී රාත්‍රි 10 ට පමණ වන විට ගෙදරට පැමිණි දිනයන් කොතෙකුත් වුවද පසුදා නැවත ගමන ආරම්භ කරන ලදි. ඒ කාර්යාලයේ තමන් වෙත පැවරී තිබූ කටයුතු නොපිරිහෙලා ඉටු කළයුතු වූ හෙයිනි.පාරිසරික විපර්යාස, දේශපාලන ගැටළු සහ නොයෙක් ප්‍රතිසංස්කරණ මධ්‍යයේ සිය රාජකාරිය කරගෙන යන ෂාමෙන් තවදුරටත් සිය රාජකාරිය ඉටු කරන්නට ඇප කැප වී ඇත.

අදික වර්ෂා කාලවලදී විදුලිය කොටන විට ඇතිවන විදුලි එලියෙන් දුම්රියෙන් බැස ගෙදරට ආ බව ඔහු පවසන්නේ සතුටින්ය. දේශපාලන ව්‍යසන අතර අමතක නොවන සිදුවීම් අත්දැකීම් අතර එක්තරා යුගයක කැලණි ගගේ පාවී ගිය මල මිනී අමතක කළ නොහැකි බව ඔහු පවසයි. එමෙන්ම ලස්සන විසිතුරු අත්දැකීම් අප සමඟ සිටින අය අතරින්ම දැක ඇති බව ඔහු පවසයි.


මුහුද ගොඩ ගැලූ අවස්ථාවේ තම කාර්යාලයේ බොහෝ අය එම ව්‍යසනයට ලක් වූ හෙයින් ආයතන ප්‍රධානීන්ගේ උපදෙස් අනුව තම සොයුරු සොයුරියන්ට අධාර බෙදා දීමට මුදල් පරිත්‍යාග කර එයින් ගෙන එන බඩු භාණ්ඩ පාර්සල් කළ ආකාරය ඔහුට දුකට පත් සතුටක්ම දනවන ලදි. මේවා බෙදා දීමට මහ ගං වතුර නොතකා ඒ මැදින් ගමන් ගත් හැටි, අප අතරම සිටින අය පීඩාවට පත්ව දුක් විඳි ආකාරය සියැසින්ම දුටු අතර අප අතරම සිටින අයගේ කුහක කම් නම් නොකියාම බැරි බවත් පවසයි. ගෙතුල සියළුම අවශ්‍ය බඩු මුට්ටු තිබියදී තම දරුවන්ට කෑම වේලක් දී ගත නොහැකි බව දැන්වූ සමහර නිලධාරීන් නිවසට යන විට සැපසේ සිටි ආකාරය ඔහු සිහි ගැන්වූයේ සමස්ථ ජාතිය කෙරෙහිම කළකිරුණු ස්වරයෙනි.

ඔහුගේ රාජකාරී අතර ඡන්ද වැඩවලට සහභාගී වීමද එක් අවස්ථාවකි. එය ඉතාමත් විනෝදජනක අත්දැකීමක් බවත් වරින් වර දෙපිට පෙරළුනු දේශපාලන ප්‍රතිපත්ති අප රට සංවර්ධනය කරා ගෙන ගියේද යන්න අප හා වාද කරයි. ඔහුගේ රාජකාරී අතර ඡන්ද වැඩවලට සහභාගී වීමද එක් අවස්ථාවකි.

මේ රට සංවර්ධනය වුවේ නම් එයටද බිඳ වැටුනා නම් ඒ සඳහාද අපිත් වග කිව යුතු නොවේදැයි පවසන ඔහු රජයේ සේවකයින් වශයෙන් මේ ඇති නැති පරතරය-ටත් අපිත් අනිවාර්යයෙන්ම වග කිවයුතු බව පවසන්නේ වාද විවාද වලට පැටළුනු අවස්ථා වලදීයි.

ඔහු අප හා නිරන්තරවම පවසන්නේ ශ්‍රී ලංකාව සිංගප්පූරුවක් හෝ ජපානයක්, චීනයක් හෝ මැද පෙරදිග රටක් නොවන බවත් එය ශ්‍රී ලංකාවක්ම විය යුතු බවත් වෙනත් රටකට අනුවර්තනය කරන්නේ නම් එයද අනුවන ක්‍රියාවක් බවත්ය. ශ්‍රී ලංකාව එයම වූ දිනක අපිත් ලොව දිනූ ජාතියක් වන බවකි.

ෂාමෙන් අපට කියන අයුරින් මේ රට ගැන දශක 3 ක පමණ කාලයක් එබඳු මිනිසුන් ලත් අත්දැකීම් තුලින් හා දැනුම තුලින් රටක සංවර්ධනය අලුතින් ගොඩ නගන්නටත් දුටුව අත්දුටුව සියල්ල ඉවහල් වනු ඇත. ඔවුන්ගේ අත් දැකීම්ද මේ ලොව ගොඩනගන්නට සහාය කර ගත හැකි වනුද ඇති. අනාගත පරපුර සුවපත් අදීන ජාතියක් කරන්නටත් අපට හැකි වන බව ඔහුගේ දශක 3 ක අත්දැකීම් සමග සහතික වෙයි. මේ තවත් එක් රාජ්‍ය සේවකයෙකි.





# 05. ප්‍රායෝගිකත්වය තුළින් ඵලදායිතාවයට ළං වෙමු...



**ගීතා ඉන්ද්‍රාණි ලියනආරච්චි**
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ආයතනයනයක හෝ ව්‍යාපාරයක සාර්ථකත්වයට ඵලදායිතාවය ඉවහල් වේ. ඵලදායිතාවයට ලගාවීම උදෙසා ආයතනයේ සියලු අරමුණු හා කාර්යයන් ප්‍රායෝගිකත්වයෙන් යුතුව සකස් වීම අත්‍යවශ්‍යයය. වර්තමානයේ ඵලදායිතාවය මැනුම් කරන විවිධ ක්‍රම අප දැක ඇත්තෙමු.එවැනි ආයතන ද බොහෝ සේ අප රටේ පමණක් නොව ලොව පුරා විවිධ සංවිධාන හරහා ක්‍රියාත්මක වේ. එම මැනුම් බොහොමයක් ලිපි ලේඛණවලට හෝ එසේ නොමැති නම් භෞතික පිළිබිබු කිරීම් සදහා මූලික වූ නිර්ණායක පදනම් කර ගත් ඇගයුම් ක්‍රම ලෙස දැකිය හැකිය.

එබැවින් එම ඵලදායිතා මිනුම් අතුරින් යම් යම් ස්ථානයන්ට පත් වුව ද එකී ආයතන හෝ ව්‍යාපාරයන් හි භාණ්ඩ හෝ සේවා සැපයීම කොතරම් කාර්යක්ෂම ද සේවා ලාභියා /පාරිභෝගිකයා සංතaප්තදායී ද යන්න මැන බැලීමක් මෙම මිනුම් ක්‍රම වේද තුළ අන්තර්ගතව ඇත්තේ ඉතා අල්ප වශයෙනි. එබැවින් අප රටේ විශේෂයෙන් ආයතන තුළ ඵලදායිතාවය අඛණ්ඩව පවත්වා ගෙන යාම අභියෝගයක් වී ඇත. එය ඇතැම් විට බලෙන් පැවරූ කාර්යයක් ලෙස සිදු කරනවා විය හැකිය. ඒ නිසා එය විවිධ කම්ටු හරහා පසු විපරම් කරමින් පවත්වා ගෙන යාමට සිදුව ඇත.

ආයතනයක ඵලදායිතාවය අඛණ්ඩව පවත්වා ගෙන යාමට එහි සේව්‍ය සේවක සබදතා ඉතා වැදගත් වේ.එමගින් එකිනෙකාගේ වගකීම් හා වගවීම් තහවුරු කරයි. එසේම ආයතනය හා සේවාලාභියා නැතහොත් ව්‍යාපාරය හා පාරිභෝගිකයා අතර අන්තර් සබදතාවය හා වැටහීම වැදගත් ය. එය කොතරම් ශක්තිමත්ද දුර්වලද යන්න මැන බැලීම ඵලදායිතාවය ට අයත් විය යුතු නිර්ණායකයකි. ඒ සදහා වැඩි ඉඩකඩක් තිබිය යුතුයි. ජපානයේ පාරිභෝගිකයා දෙවි කෙනෙකු ලෙස සළකයි.

පිරිසිදු කරන්නා ආයතනයේ වැදගත් ම කොටස් කරුවෙකි. ව්‍යාපාරිකයා පාරිභෝගිකයාගෙන් යැපෙන්නෙකි.එවැනි අන්තර් සබදතා නිසා ජපානයේ ආයතනික ඵලදායිතාවය ඉතා ඉහළින් පවතී. අප රටේ පාරිභෝගිකයා හිගන්නෙකු බවට පත් කර ඇත්තේ ව්‍යාපාරිකයා විසින් ගුණාත්මක බව පසෙක ලා තම ලාභය උපරිම කර ගැනීමේ පරම අපේක්ෂාවෙනි. බොහෝ රාජ්‍ය ආයතනවල වුවද සේවාලාභියා හිසරදයක් සේ දකී. සේවා ලාභියාගේ හැගීම හෝ සිතුවිලි හා අවශ්‍යතාවයන් ආයතනය විසින් වටහා ගතහොත් ලබා දෙන සේවය ගුණාත්මක සේවයක් ද වනු ඇත.

පාරිභෝගිකයාගේ හැඟීම හා අවශ්‍යතාවය වටහා ගැනීමට ව්‍යාපාරිකයා සමත් වන්නේ නම් වටහා ගත් අගය මත භාණ්ඩයේ මිළ හා ගුණාත්මකභාවය තීරණය වේ. එබැවින් භාණඩ හෝ සේවා සපයන ඕනෑම ආයතනයක වටහා ගත් ගුණාත්මකභාවය,පාරිභෝගික අපේක්ෂාවන් හා වටහා ගත් වටිනාකම පාරිභෝගික තෘප්තිමත් දර්ශකය වේ. මෙවැනි දර්ශකයන් ද ඵලදායිතා සංකල්ප ප්‍රායෝගිකක-රණයේ දී යොදා ගැනිම වටී.

ඵලදායිතාවය පිළිබද ජනප්‍රිය සංකල්පයක් ලෙස වර්තමානයේ ක්‍රියාත්මක 5S සංකල්පය ද ආයතනයක ඵලදායිතාවය ඉහල නැංවීම සදහා යොදා ගැනීමේ දී එහි නාස්තීන් අවම කර ගනිමින් සරල ක්‍රියාකාරකම්වලින් යුතුව එය ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික ව විය යුතුයි.ජපන් බස මුල් කර ගත් 5S වශයෙන් සදහන් වචන පහ තවත් අතකින් එහි අර්ථය අනුව මෙසේ දැක්විය හැකිය.

1. Seiri - Sort (සංවිධිත බව)
2. Seitone - Set (සුපිළිවෙල)
3. Seison - Shine (සුපිරිසිදුකම)
4. Seiketsu - Standardize (සම්මිතිය)
5. Shithsuke - Sustain (ශික්ෂණය)

ඉහත ඵලදායිතා සංකල්පය ආයතනයත් තුළ ක්‍රියාත්මක කිරීමේ දී දැනට සම්ප්‍රදායික ව සිදු කරනුයේ ආයතනයේ ලිපිගොනු / උපකරණ / යන්ත්‍ර සූත්‍ර / ද්‍රව්‍ය පිළිබද ව වැඩි අවධානයක් යොමු කර එයට 5S යොදා ගැනීමයි. නමුදු වර්තමානයේ අප රට පත්ව ඇති තත්ත්වය හමුවේ ප්‍රතිපත්ති සම්පාදනයේ දී , සැලසුම් සකස් කිරිමේ දී හා ව්‍යාපaති ක්‍රියාත්මක කිරීමේදී ද 5S හි අර්ථාන්විත බව ප්‍රායෝගික ව යොදා ගැනීම කාලෝචිත ය. එය මෙසේ ප්‍රායෝගිකකරණයට ලක් කළ හැකිය.ව්‍යාපaතියක් සම්බන්ධයෙන් ගත් කළ එය මෙසේ විග්‍රහ කළ හැකිය.



## 1. සංවිධිත බව (අවශ්‍ය දේ හා අනවශ්‍ය දේ හදුනා ගැනීම)

ව්‍යාපaතියක් සදහා වන යෝජනාව, ඊට අදාළ ව්‍යාපaති වාර්තාව වියදම් - ප්‍රතිලාභ විශ්ලේෂණය ( Cost Benefit Analysis), ශක්‍යතා අධ්‍යයනය යනාදී දේ උපයෝගී කර ගනිමින් ව්‍යාපaතියට අදාළ අවශ්‍යම දේ හා අනවශ්‍ය දේ හදුනා ගැනීම සිදු කළ හැකිය. ව්‍යාපaතියේ අරමුණට යාමට අත්‍යවශ්‍ය දේ ප්‍රමුඛතා ගත කිරීමත් අනවශ්‍ය ක්‍රියාකාරකම් ඉවත් කිරීමත් සිදු කළ යුතුය.

## 2. සුපිළිවෙල (අවශ්‍ය දේ පිළිවෙලට සකස් කිරීම)

මේ යටතේ හදුනාගත් ව්‍යාපaතිය ක්‍රියාකාරී සැලැස්මකට අනුව අවශ්‍ය ක්‍රියාකාරකම් පෙළ ගස්වා ව්‍යාපaතියේ නිශ්චිත කාල රාමුව භාවිතා කරමින් පිළිවෙලට ක්‍රියාත්මක කළ හැකිය. ව්‍යාපaතියේ ක්‍රියාත්මක සැලැස්ම සියලු දෙනාට දැකගත හැකි ආකාරයට දaෂ්‍ය මාධ්‍ය භාවිතා කරමින් ව්‍යාප aති භූමියේ ප්‍රදර්ශනය කළ හැකිය. ව්‍යාපaතියට අවශ්‍ය වන සියලූ දේ සපයා ගන්නා ආකාරය, ඇස්තමේන්තු ගත මුදල, ක්‍රියාත්මක ආයතන යනාදිය සැලැස්ම තුළ අන්තර්ගතව තිබිය යුතුයි. ඒ අනුව සුපිළිවෙල පවත්වා ගෙන යා හැකිය.


## 3. සුපිරිසිදු කම (නිරන්තර පිරිසිදු කම තබා ගැනීම)

ව්‍යපaතියක් සම්බන්ධයෙන් ගත් කළ සුපිරිසිදුකම එහි ව්‍යාප aති යේජනාව සකස් කිරීමේ සිට අවසානය දක්වා ම පවත්වා ගෙන යා යුතුයි. මෙහි දී පිරිසිදු කම යනු අල්ලස්, දූෂණ හෝ වංචා සහ සොරකම්වලින් තොර ව ව්‍යපaතියේ අරමුණ කරා යෑමට, එසේ නැතහොත් ව්‍යාපaතිය අතරමග දී කඩා වැටීමට ලක් නොවීමට එහි සෑම ක්‍රියාකාරකමක ම විනිවිදභාවයෙන් හා පවත්නා නීති රීතිවලට යටත් ව අවංකභාවයෙන් සුපිරිසිදු ව සිදු කළ යුතුයි. මෙය ව්‍යාප aතියේ නිරත ඉහළ සිට පහළ දක්වා වූ සෑම අයෙකු තුළ ම තිබිය යුතුයි.

## 4. සම්මිතිය (ප්‍රමිත කිරීම/අඛණ්ඩව වැඩි දියුණු කිරීම)

ව්‍යාපaතියක සංවිධිත බව, සුපිළිවෙල හා සුපිරිසිදුකම අඛණ්ඩ ව පවත්වාගෙන යාම ද වැදගත් ය. ඒ අනුව වැඩ පියවර හදුනා ගැනීම, ව්‍යාපaතියේ තිරසර බව පවත්වාගෙන යාම සදහා ක්‍රියාත්මක කණ්ඩායම් (ග්‍රාමීය සංවිධාන / ආයතන ආදිය) හදුනා ගත යුතු අතර, ඒ සදහා යම් යම් ප්‍රමිතීන් ලබා දිය යුතුයි. ඒ අනුව එය පවත්වාගෙන යාම සදහා ඒ ඒ කණ්ඩායම් / ආයතන වෙත බලතල ලබා දීම්, මූල්‍ය අනුග්‍රහයන් ලබා දීම, පිළිගැනීමක් ඇති කිරීම යනා දී දේ කළ හැකිය.

# 5. ශික්ෂණය (5S පුරුද්දක් හා විනය බවට පත්කර තිරසරව පවත්වා ගෙන යෑම)



ව්‍යාපaතියක් ඉහත කාරණා 04 යටතේ පවත්වා ගෙන යාමේ දී එම කරුණු සියලූ දෙනා පිළිගත් රීතියක් නැතහොත් පුරුද්දක් බවට පත්වේ. ඒ අනුව ව්‍යාපaතියක් ඉතාමත් ඉහල සංවිධිත බවකින් යුතු, අත්‍යවශ්‍ය ම දේ පමණක් ඇතුළත් , වංචාවෙන් දූෂණයෙන් තොර ව සුපිරිසිදු වූ ,දීර්ඝ කාලීනව පවත්වා ගෙන යා හැකි තිරසාර පැවැත්ම තහවුරු වූ ව්‍යාපaතියක් වන්නේ නම් එය ආදර්ශමත් ව්‍යාපaතියක් වේ. එහි නියැලි සියලූ දෙනා මනා ශික්ෂණයෙන් යුතු වූ අය වෙති.එවැනි ව්‍යාපaතියක් දිගු කාලීන ව පවත්වා ගෙන යාමට ඉදිරි කණ්ඩායමකට වුව ද හැකියාව පවතී.

ආයතනයක හෝ ව්‍යාපaතියක වුවද ශික්ෂණය පවත්වා ගෙන යෑමට කණ්ඩායම් සවිමත් වීම වැදගත් ය. ඒ සඳහා ගුණාත්මක වර්ධන කණ්ඩායම් ( QIST-Quality Improvement Support Team ) බිහි කිරීම ද, කාර්ය වර්ධන කණ්ඩායම් ( WIT-Working Improvement Team ) බිහි කිරීම ද සිදු කළ හැකිය.ඒ අනුව ආයතනයක වැඩ ප්‍රමාණය මැන බැලීමත් එහි ගුණාත්මකභාවය මැන බැලීමත් කළ හැකිය. එම කණ්ඩායම් සඳහා පුහුණුවීම් ලබා දීම, අත්දැකීම් හුවමාරුවට අවස්ථා ලබාදීම, ප්‍රතිඵල ඇගයීම යනාදිය සිදු කරමින් ආයතනයක හෝ ව්‍යාපෘතියක ශික්ෂණය ඇති කළ හැකිය. ඒ අනුව නීති ගරුක ව, ආදර්ශමත් ව එවැනි ආයතන / ව්‍යාපෘති තිරසාර ව පවත්වා ගෙන යා හැකිය.

